ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
7 වන මහල, අංක 30, ජනාධිපති මාවත,
තැ . පෙ . 590, කොළඹ 01, ශ්‍රී ලංකාව

பிரதேச அபிவிருத்தித் திணைக்களம்
7 ஆம் மாடி,இல.30 சனாதிபதி மாவத்தை கொழும்பு 1
த.பெ.இல.590,கொழும்பு 01,இலங்கை

Regional Development Department
Level 7, No. 30, Janadhipathi Mawatha, Colombo 1
P.O. Box. 590, Colombo 01, Sri Lanka.

94 11 2477447/437 94 11 2477734 rdd@cbsl.lk www.cbsl.gov.lk

යොමු අංකය : 32/04/011/0001/002

2020 නොවැම්බර් 06

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වල ප්‍රධාන විධායක නිලධාරීන්/ සාමාන්‍යාධිකාරීන් වෙත

මහත්මයාණෙනි/මහත්මියනි,

**සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකම : ණය සහන කාලය දීර්ඝ කිරීම**

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකමෙහි මෙහෙයුම් උපදෙස් හා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රාදේශීය සංවධර්න දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂ විසින් මේ සම්බන්ධව නිකුත් කරන ලද සංශෝධන හා බැඳේ.

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ව්‍යාපාර යළි නඟා සිටුවීමේ වැදගත්කම හඳුනා ගත් ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජයේ මග පෙන්වීම සහ සහභාගීත්ව මූල්‍ය ආයතන වල සක්‍රිය සහභාගීත්වය ඇතිව සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකම ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වුවත්, කොවිඩ්-19 වසංගත තත්ත්වයෙහි මෑත කාලීන ප්‍රවණතා හේතුවෙන් බොහෝ ණය ගැනුම්කරුවන් හට තම ව්‍යාපාර අපේක්ෂිත ආකාරයෙන් ගොඩනඟා ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය වී ඇත. එම නිසා ඔවුන් තම ව්‍යාපාර බිඳ නොවැටී අඛණ්ඩව පවත්වාගෙන යාමේ උත්සාහයක තව දුරටත් යෙදී සිටී.

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකමෙහි අදියර I, II හා III යටතේ ලියාපදිංචි වූ ණය ගැනුම්කරුවන් හට මාස 6ක ණය සහන කාලයක් ලබා ගැනීමේ හිමිකම පැවතියද, වතර්මානය වන විට පැතිරෙමින් පවතින කොවිඩ්-19 දෙවන රැල්ල හේතුවෙන් බොහෝ ණය ගැනුම්කරුවන් ණය ආපසු ගෙවීමේ අපහසුතාවයකට පත්ව ඇත. එසේ හෙයින්, ණය ගැ ගැනුම්කරුවන් හට ණය ආපසු ගෙවීමට පහසුකම් සැළසීමේ හා නිසි පරිදි ණය ආපසු ගෙවීමට ඔවුන් දිරිගැන්වීමේ වැදගත්කම සළකා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකම යටතේ ලියාපදිංචි වී ඇති ණය ගැනුම්කරුවන් සඳහා වන මාස 6ක ණය සහන කාලයට අමතරව අතිරේක මාස 3ක ණය සහන කාලයක් ලබා දීමට තීරණය කර ඇත.

එසේ හෙයින්, ජාතික වැදගත් කමින් යුතු අභිමතාථර් ළඟා කර ගැනීමෙහිලා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් දක්වන ලද මහඟු සහයෝගය ඉතා අගය කොට සළකන අතර, සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකමෙහි අදියර I, II, හා III යටතේ ලියාපදිංචි වී ඇති ණය ගැනුම්කරුවන් හට, ඔවුන් විසින් ඔබ වෙත සිදු කරනු ලබන ලිඛිත ඉල්ලීමට යටත්ව මාස 3ක අමතර ණය සහන කාලයක් ලබා දෙන ලෙස දන්වා සිටිමි.

මේ සම්බන්ධයෙන් දක්වන සහයෝගය ඉතා අගයකොට සළකමි.

මෙයට - විශ්වාසී,

**කේ. එම්. මහින්ද සිරිවර්ධන**

නියෝජ්‍ය අධිපති